# Sinhalese Grammar

for

**Standard VI**

by

The Revd. Theodore G. Perera

# සිංහල ව්‍යාකරණ

සවෙනි ප්‍රමාණයට

ගෞ. තියඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ

විසින්

ආණ්ඩුවේ ව්‍යවස්ථාපොතට එකඟව

සම්පාදනය කරනලදී.

කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිත යි.

1909

පොතක මිල ශත 15 යි.

# Sinhalese Grammar

for

## Standard VI

by

The Revd. Theodore G. Perera

# සිංහල ව්‍යාකරණ

සවෙනි ප්‍රමාණයට

ගෞ. තියඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ

විසින්

ආණ්ඩුවේ ව්‍යවස්ථාපොතට එකඟව

සම්පාදනය කරනලදී.

කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිත යි.

1909.

# සිංහල ව්‍යාකරණ

# Sinhalese Grammar

## සවෙනි ප්‍රමාණයට.

1. පූර්වාපර වර්ණයන්ගේ ගැලපීම සන්ධි බැවි මීට ප්‍රථම ග්‍රන්ථයක දක්වන ලද්දේය. මීට භාෂාන්තර වල සංහිතායයිද කියනු ලැබේ.

2. මිශ්‍රසිංහල භාෂාවෙහි ශුද්ධ සිංහල සන්ධිය, සංස්කෘත සන්ධියයි කොටස් දෙකෙක් ඇතිවෙත්.

3. සංහිතා කාර්‍ය්‍යය පිණිස ලොපය, ආදෙශය, ආගමය, විඣය, වෘද්ධිය යන ව්‍යාකරණ විධි දැනීම අවශ්‍යයෙන් වුවමනාය.

4. ලොපය, ආගමය, විඣය යනු කුමක්දැයි මීට ප්‍රථම ග්‍රන්ථයක දක්වන ලද්දේය.

(1) ආදෙශයයනු ගාත්‍රාක්ෂරයක්වෙනුවට අන්‍ය ගාත්‍රාක්ෂරයක් පැමිණවීමවේ. සඳ යන ශබ්දය හඳකියා සකාරය වෙනුවට හකාරයාගේ පැමිණීමෙන්ද, සුගඳ යන ශබ්දය සුවඳ කියා ගකාරය වෙනුවට වකාරයාගේ පැමිණීමෙන්ද සිද්ධවී තිබේ.

(2) වෘද්ධිය යනු මාත්‍රාවකගේ හෝ ඌන මාත්‍රාවකගේ වැඩීමයි. උවරණ යන්නෙහි වකාරයේ ඇති අකාරය වෘද්ධිවීමෙන් වා යන්නවී උවාරණ කියාද අග යන්නේ ගයන්හි ඇති ඌනමාත්‍රා අර්ධ සංයොගය වෘද්ධිවීමෙන් සම්පූර්ණ බින්දුවක්වී අං කියාද සෑදේ.

## 1. ශුද්ධ සිංහල සන්ධි.

5. ශුද්ධ සිංහල භාෂාවෙහි සන්ධි දසයක් ඇති.* එනම්:-

1. පූර්වස්වර ලෝප සන්ධිය (පෙරසර ලොප්සඳ)
2. පරස්වර ලෝප සන්ධිය (පරසර ලොප්සඳ)
3. ස්වර සන්ධිය (සරසඳ)
4. ස්වරාදේශ සන්ධිය (සරදෙස්සඳ)
5. ගාත්‍රාදේශ සන්ධිය (ගතදෙස්සඳ)
6. පූර්වරූප සන්ධිය (පෙරරූසඳ)
7. පරරූපසන්ධිය (පරරූසඳ)
8. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (ගතකුරුලොප්සඳ)
9. ආගම සන්ධිය (අගම්සඳ)
10. ද්විරූප සන්ධිය (දෙරූසඳ)

යනමොහුයි.

6. පූර්වස්වරලෝප. ආගම, ද්විරූප යන සන්ධිතුන මීට ප්‍රථම ග්‍රන්ථයක විස්තර කරනලද්දේය.

## 1. පරස්වරලෝප සන්ධිය.

7. පූර්වස්වරය තිබියදී පරස්වරය ලොප්කිරීමෙන් ගළපනසන්ධිය පරස්වරලෝප සන්ධි නම්.

"මැණි" යන පදයත් "උතුමා" යන පදයත් එක්ලඟව පැමිණිකල මුල්පෙදේ අගඅකුරවන තියන්නේ ඇති ඉයන්නත් පසුපෙදේ මුල්අකුර වන උයන්නත් සන්ධිවන අකුරුවෙත්. මේ ස්වරදෙකින් පූර්වස්වරය එලෙස තිබියදීම පරස්වරය මකාදමනු ලැබේ. එවිට මැණිතුමා කියා සිඬවේ.

8. මේ සන්ධික්‍රමයට වර්ණගැළපීම පිණිස සන්ධිවනතැන ස්වරදෙකක් ඇතිවියයුතුයි. ඒදෙක සමාන ස්වර හෝ අසමාන ස්වරවෙති.

---

* සිදත්සඟරාවේ ඇත්තේ සන්ධි නවයක් පමණකි. පරරූප සන්ධිය එහි නොපැණේ.

සමාන ස්වරයන්ට උදාහරණ.

හබර + අල = හබරල (අලවර්ගයක්)
මුනි + ඉඳු = මුනිඳු (මුනීන්ද්‍ර)
ගුරු + උතුමා = ගුරුතුමා (ආචාර්යවරයා)

අසමාන ස්වරයන්ට උදාහරණ.

නි + අයුණු = නියුණු (අගුණතුන)
යති + උතුමා = යතිඳුමා (තාපසෝත්තමයා)
උඩ + ඊළිපත = උඩළිපත (උළුවස්සේ උඩලීය)

## 1 වෙනි අභ්‍යාස පාඨය.

1. තඹඅල, මුනිඋතුමා, අටඋතුරු, වැටුඅසිපත, කිවිඉඳු යන ශබ්දයන් සන්ධිකොට ගළපනු.

2. උපලේසුම්, සුස්මෙත්, ඇටලිපත, වරහන, සුරතුම යන ශබ්දයන් විසන්ධිකොට අර්ථ දක්වනු.

## 2 ස්වර සන්ධිය.

9. ස්වර ලොපාදියක් නොමැතිව පරපෙදේ මුලින් ඇති ස්වරය පෙරපෙදේ අගසිටි ගාත්‍රාක්ෂරයාහට පැමිණවීමෙන් ගළපන සන්ධිය ස්වරසන්ධි නම් වේ.

"නිල්" යන පදයත් "උපුල්" යන පදයත් එක ලගට පැමිණිකල මුලපෙදේ අගඅකුරවන "ල්" යන් නහට, පසුපෙදේ මුලකුරවූ "උ" යන්න පැමිණවූකල නිලුපුල් කියා සිඩවේ.

10. මේ සන්ධික්‍රමයට වර්ණගැලපීම පිණිස පූර්ව පදේ අන්ත්‍යාක්ෂරය හුදුගනකුරක් වියයුතුයි. උත්තර පදේ ආද්‍යක්ෂරය ස්වරයක් වියයුතුවේ.

උදාහරණ

මල් + අසුන = මලසුන (පුෂ්පාසන)
රුවන් + ආර = රුවනාර (රත්නාකර)
එක් + ඇස් = එකැස් (සිකුරුහෝකණා)
එඩින් – ඇත = එඩිනැත (ඉන්එහා)

| | | | | | |
|---|---|---|---|---|---|
| නරන් | + | ඉඳු | = | නරිඳු | (රජ) |
| රන් | + | ඊල් | = | රනීල් | (රන්ඔවිල්ල) |
| පියුම් | + | උපුල් | = | පියුමුපුල් | (පද්මොත්පල) |
| සිහිල් | + | ඌල් | = | සිහිලූල් | (සීතලඋල්පත) |
| එදින් | + | එද | = | එදිනෙද | (එදිනෙන්එදින) |
| රන් | + | ඒය | = | රනේය | (සුවර්ණසෙතුව) |
| ඔවුන් | + | ඔවුන් | = | ඔවුනොවුන් | (අන්‍යොන්‍ය) |
| මල් | + | ඕලඹු | = | මලෝලඹු | (මල්එල්වතලද) |

———co———

## 2 වෙනි අභ්‍යාස පාඨය.

1. සහස්ඇස්, පස්ඇස්, සුරන්ඉඳු, එකින්එක, උන් උන් යන ශබ්ද සන්ධිකොට ගළපනු.

2. සොවිනොබල, සියලඟ, ගොසිනෙත, අනුන්, නුවනිඳුවරයන ශබ්ද විසන්ධිකොට අර්ථදක්වනු.

## 3. ස්වරාදේශ සන්ධිය.

11. උභයපක්ෂයෙන් එකළඟ සිටි අ, ඉ, වෙනුවට එ ද, අ, උ වෙනුවට ඔ නොහොත් ඕ ද පැමිණීමෙන් ගැළපෙන සන්ධිය ස්වරාදේශසන්ධි නම්.

මහයන පදයත් ඉසියන පදයත් එකළඟ සිටි කල මුලපෙදේ හකාරස්ථ ස්වරය වන අයන්න හා පසුපෙදේ ආදිස්වරය වන ඉයන්න ලොප්වී ඒ වෙනුවට එකාරය පැමිණ එය හකාරස්ථවීමෙන් මහෙසි කියා සිදුවී නැවත මෙහෙසි කියා සෑදේ. මෙහි මයන්නේ ඇති අකාරය ඉකාරයට පෙරළී "මෙ"යන්න වී තිබේ. එසේ එකස්වරයක් වෙනස්වරකට මාරුවීමට ස්වර විපර්‍යාසය හෙවත් පිළිපෙරළියයි කියනුලැබේ. සුබොච්චාරණය පිණිස ඇතම් ශබ්දවල ඒ ආකාර ස්වර විපර්‍යාසකිරීම එක් ව්‍යාකරණ විධියකි.

අ, උ වෙනුවට "ඔ" පැමිණීම

වට + උර (පද දෙක) [කල)
වට් + (අ + උ)ර (ටකාරස්ථ අකාරය අහක්කළ

වච් + ඔ ර (අ, උ වෙනුවට ඔ පැමිණීකල)
වචොර (ඔකාරය වකාරස්ථ කලකල)

චචොර යනු වටවූ කලවයයි.

අ, උ වෙනුවට "ඔ" පැමිණීම.

තඹර + උර (පදදෙක) [කල)
තඹර් + (අ + උ)ර (රකාරස්ථඅකාරය අහක්කල
තඹර් + ඕ ර (අ,උ වෙනුවට ඕ පැමිණීකල)
තඹරෝර (ඕකාරය රකාරස්ථවූකල)

තඹරෝර යනු තාමරස කුසුම්යයි.

**සැලකියයුතුයි:**— (1) මේ සන්ධි විධිය භාෂාන්තර සව ර සංහිතාක්‍රමයට අනුව යොදගන්නා ලද්දක් බැව් පෙනේ.

(2) මේ සන්ධි ක්‍රමයේ අ, ඉ වෙනුවට එ පැමිණීමත්, අ, උ වෙනුවට ඔ නොහොත් ඕ පැමිණීමත් සිදු වන්නේ අක්ෂර උත්පත්තිස්ථාන සලකාගනම වේ. අයන්න කණ්ඨජයි. උයන්න තාලුජයි. ඒනිසා ඒදෙක වෙනුවට කණ්ඨ තාලුජ අක්ෂරයක්වන "එ" යන්න පැමිණේ. නැවතද අයන්න කණ්ඨජයි. උයන්න ඔෂ්ඨජයි. ඒනිසා ඒදෙක වෙනුවට කණ්ඨෞෂ්ඨජ අක්ෂරයක් වන ඔකාරය පැමිණේ.

(3) පූර්වස්වරලොප, පරස්වරලොප, ස්වරාදෙශ යන ත්‍රිවිධ සන්ධි ක්‍රමයට වර්ණ ගැළපීම පිණිස ස්වර දෙකක්ම ඇතිවිය යුතුවේ. ඒ අඳ මේ ස්වර දෙකක් ගළපා සන්ධිකරගැනීම ඔය තුනෙන් කොයි සන්ධික්‍රම යට කලයුතුද යනු ශිෂ්ට යෙදුම්වලින් දතයුතුයි. දින + ඉසුරු යන්න දිනෙසුරු කියා සන්ධිනොකොට දිනිසුරුකියාද, මහ + ඉසි යන්න මහිසි කියා සන්ධි නොකොට මෙහෙසි කියාද සන්ධිකරගන්නේ ශිෂ්ට ව්‍යවහාරය අනුවය.

### 3 වෙනි අභ්‍යාස පාඨය.

1. මහ ඉසුරු, මහ උර, ලඹ උරු යන ශබ්ද සන්ධිකොට ගළපනු.

2. අඹරෝර, සහෝදර, මහෝදර යන සන්ධි විසන්ධිකොට දක්වනු.

---

### 4 ගාත්‍රාදෙශ සන්ධිය.

12. සන්ධිකළයුතු පූර්වාපර ගාත්‍රාක්ෂරයකට අන්‍ය ගාත්‍රාක්ෂරයක් ආදෙශ කිරීමෙන් ගළපන සන්ධිය ගාත්‍රාදෙශ සන්ධියනම් වේ.

"පිළි" සහ "කම්" යන වචන දෙක එකලඟට පැමිණිකල අපර වර්ණයවූ කකාරය යකාරාදෙශවී පිළියම් කියා සිද්ධවේ.

"සුණු" සහ "කම්" යන ශබ්ද දෙක එකලඟ සිටිකල අපර වර්ණයවූ කකාරය වකාරාදෙශවී සුණුවම් කියා සිද්ධවේ.

සැලකියයුතුයි:—පිළිකම් යන තන්හි කකාරයට යකාරාදෙශ වන්නෙත්, සුණුකම් යන තන්හි කකාරයට වකාරා දෙශවන්නෙත් ළියන්නෙහි ඇති ඉයන්න තාලව්‍ය අක්ෂරයක් හෙයින් තාලුජ අක්ෂරයක්වූ යකාරය ඊට ආසන්න නිසාද, ණුයන්නෙහි ඇති උකාරය ඔෂ්ඨජාක්ෂරයක් සෙයින් දන්තෞෂ්ඨජවූ වකාරය ඊටආසන්න නිසාද වේ. මේ සන්ධි ක්‍රමයේ ගාත්‍රාක්ෂර ආදෙශවන්නේ බහුලවශයෙන් මේනැයින්ය.

13. පූර්වවර්ණයවූ ගාත්‍රාක්ෂරයකට අන්‍ය ගාත්‍රාක්ෂරයක් ආදෙශවන තැන ස්වරලොපයද සිදුවේ.

"සුදු" සහ "බත්" යන ශබ්ද දෙක එකලඟට පැමිණිකල පූර්ව වර්ණයවූ දුකාරයාගේ උයන්න ලොප්

කොට තකාරාදෙශ කළ කල්හි සුත් බත් කියා සිද්ධවේ.

පරගාත්‍රාක්ෂරාදෙශයට තවත් උදාහරණ.

සිත + කරු = සිත්වරු
දඩ + කම් = දඩයම්
ගිනි + කම් = ගිනියම්
දඬු + කම් = දඬුවම්

පූර්ව ගාත්‍රාක්ෂරාදෙශයට තව උදාහරණ.

හෙබ + තොට = හෙබ් + තොට = හෙප්තොට
ලබු + නාරඟ = ලබ් + නාරඟ = ලප්නාරඟ

——oo——

## 4 වෙනි අභ්‍යාස පාඨය.

1. බිලි, කම්; අත්, කරු; මහණ, කම්; කැසුබු, පොතු යන ශබ්ද ගළපා සන්ධිකරනු.

2. සුරුවම්; බුත්සරණ; පිරියම්; කප්පිල් යනු විසන්ධිකොට අර්ථ දක්වනු.

——oo——

## 5 පූර්ව රූපසන්ධිය.

14. පූර්ව වර්ණයාගේ රූපය පරවර්ණයා හටද ඇතිකිරීමෙන් ගළපන සන්ධිය පූර්වරූප සන්ධි නමි.

"කම්" සහ "හල්" යන ශබ්ද දෙක එකලග සිටිකල පරවර්ණයවූ හකාරය පූර්ව වර්ණයවූ ම් කාරයාගේ රූපය ගැනීමෙන් කම්මල් කියා සිදුවේ.

තව උදාහරණ

විස් + කම් = විස්සම් (විශ්වකර්මයා)
සිත් + කම් = සිත්තම් (චිත්‍රකර්මය)
ඇස් + හමු = ඇස්සමු (ප්‍රත්‍යක්ෂ)
ඇත් + හල් = ඇත්තල් (හස්තිශාලාව)

——oo——

### 5 වෙනි අභ්‍යාස පාඨය.

1. පන්, කම්; ගෙන්, කම්; අස්, හල්; රඹුක්, වන; අත්, වන යනශබ්ද සන්ධිකොට ගළපනු.

2. වත්තම්, සිත්තරු, බත්තුල, අත්තරු යන ශබ්ද විසන්ධිකොට අර්ථ දක්වනු.

---

### 6 පරරූප සන්ධිය.

15. පරවර්ණයාගේ රූපය පූර්වවර්ණයා හටද ඇති කිරීමෙන් ගළපන සන්ධිය පරරූප සන්ධිනම්.

"සත්" සහ "දවස" යන ශබ්ද දෙක එකළඟ සිටිකල පූර්ව වර්ණයවූ ත් කාරය පරවර්ණයාවූ ද කාර යාගේ රූපය ගැනීමෙන් සද්දවස කියා සිද්ධවේ.

තව උදාහරණ

වප් + කඩ = වක්කඩ (දියබැම්ම)
ලිප් + ගල = ලිග්ගල (ලිපේගල)
අත් + ලස් = අල්ලස් (ලඤ්ජය)

---

### 6 වෙනි අභ්‍යාස පාඨය.

1. දුක්, පත්; සත්, දන; අත්, ගළා; කොක්, ගල යන ශබ්ද සන්ධිකොට ගළපනු.

2. ගොක්කොළ, යග්ගිරිලෙන, දිග්ගල, ලද්දන යන ශබ්ද විසන්ධිකොට අර්ථ දක්වනු.

---

### 7 මාත්‍රාක්ෂර ලොපසන්ධිය.

16. මාත්‍රාක්ෂරයක් ස්වරයක් සමග ලොප්කොට මාත්‍රාවෘද්ධි කිරීමෙන් ගළපන සන්ධිය මාත්‍රාක්ෂර ලොප සන්ධිනම්.

"උමග" සහ "දු" යන ශබ්ද දෙක එකලඟ සිටි කල පූර්ව වර්ණය වන ග කාරයේ අර්ධ සංයෝගය ඉතිරි වනසේ ස්වර සහිතව ලොප්කොට ඒ ඉතිරි අර්ධ සංයෝගය වෘද්ධි කළකල උමංදුකියා සිද්ධවේ.

සැලකිය යුතුයි. මේ සන්ධි ක්‍රමයට ගැළපෙන පද දෙකේ පූර්ව පදයාගේ අන්ත වර්ණය නිතරම අර්ධ සංයෝගය සහිත අකුරක් වියයුතුයි.

අනුස්වාරාර්ධ වෘද්ධියට උදාහරණ.

ගඟ + රන් (පද දෙක)

ග ( + රන් (ගකාරය ස්වරයත්සමග ලොප්කළකල)

ගංරන් (අර්ධ සංයෝගය වෘද්ධිකළකල)

ගංරන් යනු ගඩගා සවර්ණයි.

න් කාරාර්ධ වෘද්ධියට උදාහරණ.

ලිඳ + මැඩි (පදදෙක)

ලි( + මැඩි (දකාරය ස්වරසමග ලොප්කළකල)

ලින් මැඩි (අර්ධ සංයෝගය වෘද්ධිකළකල)

ලින් මැඩි යනු කූපමණ්ඩූකයි.

ම් කාරාර්ධ වෘද්ධියට උදාහරණ.

අඹ + මල් (පදදෙක)

අ( + මල් (බකාරය ස්වරසමග ලොප්කළකල)

අම්මල් (අර්ධ සංයෝගය වෘද්ධිකළකල)

අම්මල් යනු ආම්‍රපුෂ්පයි.

---

### 7 වෙනි අභ්‍යාස පාඨය.

1. ගඟ, වතුර; ලිඳ, පඩිය; නෙලුඹු, මල්; දඹ, පොතු යන ශබ්ද සන්ධිකොට ගළපනු.

2. මංසලකුණු; හන්පලින්; මුංඇට; දම්කුඩු; වංඩුතු යන් ශබ්ද විසන්ධිකොට අර්ථ දක්වනු.

ආගම සහ විරූපසන්ධි මීටප්‍රථම ග්‍රන්ථයක විස්තර කරනලද්දේය.

## 2. සංස්කෘත සන්ධි.

17. මිශ්‍ර සිංහල භාෂායෙහි ව්‍යවහාරවන සංස්කෘත වචන ඒ භාෂාවේ සංහිතාක්‍රමානුගතව සන්ධිකළ යුතුවේ.

18. සංස්කෘත භාෂායෙහි ස්වර සන්ධිය, ව්‍යඤ්ජන සන්ධියයි සංහිතාක්‍රම දෙකෙක් වෙති.

### 1. ස්වර සන්ධි.

19. "අ" හෝ "ආ" ටපරව "අ" හෝ "ආ" පැමිණිකල්හි ඒ ස්වරදෙක එකට ගැලපී "ආ" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

ශශ + අඞ්ක = ශශාඞ්ක (චන්ද්‍රයා)
දේව + ආලය = දේවාලය (දේවගෘහ)
දයා + අර්ණව = දයාර්ණව (කරුණාසාගර)
මහා + ආසන = මහාසන (උතුම් ආසනය.)

20. "ඉ" හෝ "ඊ" ටපරව "ඉ" හෝ "ඊ" පැමිණිකල ඒ ස්වරදෙක එකට ගැලපී "ඊ" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

ගිරි + ඉන්ද්‍ර = ගිරීන්ද්‍ර (පර්වතරාජ)
කවි + ඊශ = කවීශ (කවීන්ද්‍ර)
මහී + ඉන්ද්‍ර = මහීන්ද්‍ර (රජ)
ලක්ෂ්මී + ඊශ = ලක්ෂ්මීශ (විෂ්ණු)

21. "උ" හෝ "ඌ" ටපරව "උ" හෝ "ඌ" පැමිණිකල ඒ ස්වරදෙක එකට ගැලපී "ඌ" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

විධු + උදය = විධූදය (චන්ද්‍රෝදය)
ලඝු + ඌර්මි = ලඝූර්මි (කුඩා දියවැල)

බධූ + උත්සව = බධූත්සව (ස්ත්‍රිමඞ්ගල්‍ය)
භූ + ඌර්ධ්ව = භූර්ධ්ව (පොළොවෙන් උඩ)

22. "ඍ" දෙකක් එකළඟට ආකල ඒ දෙක එකට ගැළපී "ඎ" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

පිතෘ + ඍණ = පිතෲණ (පියාගේ ණය)

23. "අ" හෝ "ආ" ටපරව "ඉ" හෝ "ඊ" පැමිණිකල්හි ඒ ස්වර දෙක එකට ගැළපී "එ" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

දෙව + ඉන්ද්‍ර = දෙවේන්ද්‍ර (දෙවිරජ)
ගණ + ඊශ = ගණේශ (ගණපති)
මහා + ඉන්ද්‍ර = මහේන්ද්‍ර (ශ්‍රෙෂ්ඨාධිපති)
රමා + ඊශ = රමේශ (විෂ්ණු)

24 "අ" හෝ "ආ" ටපරව "උ" හෝ "ඌ" පැමිණිකල ඒ ස්වර දෙක එකට ගැළපී "ඔ" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

නිල + උත්පල = නිලෝත්පල (නිල් මහනෙල්)
ගෘහ + ඌර්ධ්ව = ගෘහෝර්ධ්ව (ගෙයි උඩභාගය)
ගඞ්ගා + උදක = ගඞ්ගෝදක (ගඞ්ගාජලය)
මහා + ඌර්මි = මහෝර්මි (මහ දියවැල)

25. "අ" හෝ "ආ" ටපරව "ඍ" පැමිණිකල්හි ඒ ස්වර දෙක එකට ගැළපී "අර්" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

දෙව + ඍෂි = දෙවර්ෂි = (දිව්‍යඍෂි)*
මහා + ඍෂි = මහර්ෂි = (මහාමුනි)

26. කිසිතැනෙක "අ" හෝ "ආ" ටපරව "ඍත" යනු ආකල්හි ඒ ස්වරදෙක එකට ගැළපී "ආර්" බවට පැමිණේ. ඒ මෙලෙසයි:—

ශීත + ඍත = ශීතාර්ත =(සීතල විසින් පෙළෙන)
ක්ෂුධා + ඍත = ක්ෂුධාර්ත =(සාගින්න විසින් පෙළෙන)

---

* සන්දර්ශනය–දෙව + ඍෂි
දෙව්– (ඍ–සා)ෂි
දෙව්–අර්ෂි
දෙවර්ෂි

හෝ "ආ" වපරව "එ" හෝ "ඓ" පැමි
ස්වරදෙක එකට ගැලපී "ඓ" බවට පැ
ලෙසයි:–

= එකෛක (එකඑක)
ය = මනෛක්‍ය (මතසියල්ල)
වත= මෛහෛරාවත (ඉන්ද්‍රයාගේ මහ ඇතා)

හෝ "ආ" වපරව "ඔ" හෝ "ඖ"
ඒ ස්වරදෙක එක්ව ගැලපී "ඖ" බවට
වලෙසයි:–

= ජලෞඝ (ජලරාශිය)
දාර්ය= විතෞදාර්ය (හිතේඋදාරභාවය)
= ගංගෞඝ (ගංගාදියපාර)
ෂධ = මහෞෂධ (අමුඉගුරු)

හෝ "ඊ" වපරව (ඉ,ඊහැර) අන්‍ය ස්වර
ගල්හි පූර්ව ස්වරය ලොප්ව එතැනට "ය්"
වලෙසයි:–

ාශ = අභ්‍යවකාශ (එලිමහන්තැන)
ර = අත්‍යාචාර (දුෂ්ටහැසිරීම)
= අභ්‍යුදය (සමෘද්ධබව)
= ප්‍රත්‍යූෂ (උදෑසන)
ට = මුන්‍යෘෂභ (මුනිශ්‍රෙෂ්ඨ)
= ප්‍රත්‍යෙක (තනි,එකම)
ශ්වර්ය = අත්‍යෛශ්වර්ය (ඉතා ඉසුරු)

---

තය- අභි – අවකාශ
අභ් – ඉ – අවකාශ
අභ් – ය් – අවකාශ
අභ් – ය්වකාශ
අභ්‍යවකාශ

දධි - ඔදන = දධ්‍යොදන (දීබත්)
නදී - අම්බු = නද්‍යම්බු (ගංගාජලය)
දෙවී - ආගතා = දෙව්‍යාගතා (දේවියගේ පැමිණීම)

අසවී-උකතා = අස්‍වූකතා (තමාගේයයි නොකියනලද)
ශශි-ඌර්ධ්වග = ශශ්‍යූර්ධ්වග (හඳඉහළ නැගීම)
බලී-ඍෂභ = බල්‍යෂභ (බලවත් ගොනා)
සරස්වතී-ඒෂණ = සරස්වත්‍යෙෂණ (සරසවි සෙවීම)
බලී-ඓරාවන =බලෛ‍්‍යරාවන(බලවත් ඓරාවනයා)
සරස්වතී-ඔඝ = සරස්වත්‍යොඝ (සරස්වතීනදීජලය)
වාණී-ඖචිත්‍ය = වාණ්‍යෞචිත්‍ය(වචනයේ උචිතතාව)

30 "උ" හෝ "ඌ" වපරව(උ ඌ හැර)අන්‍ය ස්වරයක් පැමිණිකල්හි පූර්වස්වරයලොප්ව එතැනට "ව්" පැමිණේ.

අනු - අය = අන්වය (පරම්පරාව)*
සු - ආගත = ස්වාගත (හොඳින්පැමිණී
මධු - ඉදම් = මධ්විදම් (මේ මිය)
සාධු - ඊහිත = සාධ්වීහිත (මනාඋත්සාහය)
මධු - ඍතෙ = මධ්වෘතෙ (මීහැර)
අනු - ඒෂණ = අන්වෙෂණ (සොයාබැලීම)

*සන්ධිනය. අනු - අය
අන් - උ - අය
අන් - ව් - අය
අන්වය

ගුරු - ඓශ්වර්‍ය = ගුවෛශ්වර්‍ය (බරඉසුරු)
මධු - ඔදන = මධ්වොදන (මීබත්)
භූ - අර්ධ = භ්වර්ධ (අඩබිම)
වධූ - ආලය = වධ්වාලය (ස්ත්‍රීගෘහය ආදිවශයෙනි)

31. "ඍ" ට පරව (ඍ හැර) වෙන ස්වරයක් සිටි කල පූර්වස්වරය ලොප්වී "ර්" පැමිණේ. ඒමෙලෙසයි:-

*මාතෘ - අර්ථ = මාත්‍රර්ථ (මවගේධනය)
පිතෘ - ආසන = පිත්‍රාසන (පියඅසුන)
භාතෘ - ඉභ = භාත්‍රීභ (සොහොයුරුවැනි) ආදිවශයෙනි.

32. "එ" ට පරව ("එ" හැර) වෙන ස්වරයක් සිටි කල පූර්වස්වරය ලොප්ව එතැනට "අය්" පැමිණේ. ඒ මෙලෙසයි:-

නෙ - අන = නයන (ඇස)

33. "ඔ" ට පරව ("ඔ" හැර) වෙන ස්වරයක් සිටි කල පූර්වස්වරය ලොප්ව එතැනට "අව්" පැමිණේ.

ලො - අන = ලවන (ලුණු)

## 2. ව්‍යඤ්ජනසන්ධි.

34. පෙරව අඝොෂාක්ෂර හා පරව ඝොෂාක්ෂර හෝ ස්වර ඇතිවිට අඝොෂයාට ඝොෂයෙක් ආදෙශ වෙයි.

---

* මාතෘ - අර්ථ    නෙ - අන
මාත් - ඍ - අර්ථ    න් - එ - අන
මාත් - ර් - අර්ථ    න් - අය් - අන
මාත්රර්ථ    නයන
මාත්‍රර්ථ

දික් + විජය = දිග්විජය (දිශාවන් ජයගැන්ම)
අච් + අන්ත = අජන්ත. (ඉතාකෙළවර)
ෂට් + වර්ණ = ෂඩ්වර්ණ. (වර්ණසය)
තත් + භව = තද්භව. (එයින් බිදුණු)
අප් + ජ = අබ්ජ. (පද්මය, හෝ, දියෙහි හටගත්තක්)

35. පෙරව දන්ත්‍යාක්ෂර හා පරව තාලව්‍යාක්ෂර ඇතිවිට දන්ත්‍යයාහට තාලව්‍යයෙක් ආදෙශවේ.

තත් + ශිත්‍ත= තච්ශිත්‍ත (එයින්සිදිනලද)
සත් + ජන = සජ්ජන. (සත්පුරුෂ)
තත් + චූර්ණ = තච්චූර්ණ. (ඒසුණු)
තත්. + ඡායා = තච්ඡායා. (ඒසෙවන)
රාජන් + ජය = රාජඤ්ජය. (රජුන් දිනීම)

36. පෙරව දන්ත්‍යාක්ෂර හා පරව මූර්ධන්‍යාක්ෂර ඇතිවිට දන්ත්‍යයාහට මූර්ධන්‍යාක්ෂරයෙක් ආදෙශවෙයි.

තත් + ටීකා = තට්ටීකා (එහිවර්ණනාව)

37. පෙරව තවර්ගාක්ෂර හා පරව ලකාරය ඇති විට තවර්ගාක්ෂරයාට ලකාරයෙක් ආදෙශවෙයි.

විද්‍යුත් + ලතා = විද්‍යුල්ලතා (විදුලිය)

38. ස්වරයාගෙන් පරවූ ඡකාරය ඩිත්වකළ විට පෙරතුච්සිටි ඡකාරයා අල්පප්‍රාණවෙයි.

වට + ඡායා = වටච්ඡායා. (නුගසෙවන)

39. අකාරයෙන් පරවසිටි විසර්ගයා පූර්ව, ඝොෂාක්ෂරයක් පරවූවිට, අ උ දෙදෙනාට පරවූ විසර්ගයාට „උ,, ආදෙශව, නැවත අ, උ, මෙනුවට ඔකාරයවේ.

අහඃ + රාත්‍ර = අහොරාත්‍ර (දිවා රෑ)
ශිරඃ + ධාතු = ශිරොධාතු (හිස්දා)
යශඃ + රාශි = යශොරාශි (කීර්ති සමූහය)
තපඃ + වන = තපොවන (තවුසන්ට සුදුසු වනය)

40. අවර්ණය හැර වෙන ස්වරයකින් පරවසිටි විසර්ගයාට ඝොෂාක්ෂරයක් පරවූවිට රකාරාදෙශවෙයි.

නිඃ + දයා = නිර්දයා (දයාවක්නැති)
දුඃ + ජන = දුර්ජන (අසත්පුරුෂ)
චතුඃ + වෙද = චතුර්වෙද(වෙද සතර)

41. විසර්ගයා පූර්ව, අඝොෂාක්ෂරයක් පරවූවිට සමහර තැනෙක විසර්ගයාට ස, ෂ, හෝ ශ ආදෙශවේ.

අයඃ + කාන්ත = අයස්කාන්ත (කාන්දම්)
දුඃ + කර = දුෂ්කර (කිරීම අමාරු)
දුඃ + ශාධ්‍ය = දුශ්ශාධ්‍ය (සුවකිරීමට අමාරු)

42. පෙරතුවසිටි විසර්ගයාට ච ඡ පරවූවිට ශකාරාදෙශවේ.

කඃ + චින්ත්‍යඃ = කශ්චින්ත්‍යඃ (කාගේසිතිවිලි)
භවතඃ + ඡාගඃ = භවතශ්ඡාගඃ(පින්වතාගේඑළුවා)

පෙරතුව සිටි විසර්ගයාට ට ඨ පරවූවිට ෂකාරාදෙශ වෙයි.

කඃ + ටීකතෙ = කෂ්ටීකතෙ (කවරකු විස්තර කරන ලදද)

---o---

## 8 වෙනි අභ්‍යාස පාඨය.

1. මෙහි පහත දක්වන වචන සන්ධිකොට ගළපනු.

කාරණ + අකාරණ; මුනි + ඉන්ද්‍ර; ගුරු + උපදෙශ; සුර + ඉන්ද්‍ර; ධර්ම + උපාය ; දිව්‍ය + ඓශ්වර්‍ය ; දිව්‍ය + ඖෂධ ; ප්‍රති + උත්තර ; මනු + අන්තර ; පිතෘ + අර්ථ; තත් + ගුණ; තත් + ශිෂ්‍ය; චර්ම + ඡේද; නිඃ + ජරා; නිඃ + චල.

2. මෙහි පහත දක්වන වචන විසන්ධිකොට පෙන්වනු.

ගුණාගුණ; ධරණීන්ද්‍ර; ලඝූපාය; ලංකේශ; කෘතෝපකාර; කාරණෛකක; ගුණෞඝ; ප්‍රත්‍යුත්පන්න; අන්වේෂණ; භවනි; වාග්දණ්ඩ; තච්ඡායා; තල්ලීලා ආයුර්වේද; දුෂ්කෘත.

## ක්‍රියා මාලාව.

### The Conjugation of Verbs.

43. ක්‍රියා හෙවත් ආඛ්‍යාතපද වනාහි කාල, කාරක, පුරුෂ සහ වචන භජනය කරන්නෝයි. කාල කාරකාදියට ක්‍රියාවන්ගේ වරනැඟීම ක්‍රියා-මාලාව නම්වේ.

44. ක්‍රියාපදයන්ට කාලතුනක්ද, පුරුෂතුනක් හා වචන දෙකක්ද ඇතිබැවි මිට ප්‍රථම ග්‍රන්ථයක විස්තරකරන ලද්දේය.

කාරක යන්නෙන් ක්‍රියාවගේ ධාරකත්වය ප්‍රකාශ කෙරේ. මිට සාධන යනුද ව්‍යවහාරයි. කර්තෘ, කර්ම, භාව කියා කාරක හෙවත් සාධන තුනෙක්වෙති.

(1) ක්‍රියාව කර්තෘටභාරව කියනකලැ ඒකර්තෘ කාරක ක්‍රියානම්.

"ඔහු බීවේය" යන වාක්‍යයෙහි බීවේය යන ක්‍රියාව ඔහුයන කර්තෘටභාරව යොදුතිබේ. බිවේය යන ක්‍රියාව සිද්ධකරන්නේ ඔහුයන කර්තෘයි.

(2) ක්‍රියාව කර්මයට භාරව කියනකලැ ඒ කර්ම කාරක ක්‍රියානම්.

"ඔහුට දියපෙවුණි" යන වාක්‍යයෙහි පෙවුණි යන ක්‍රියාව දියයන කර්මයට භාරව යොදුතිබේ. පෙවුණි යන ක්‍රියාව සිද්ධකරන්නේ දියයන කර්මයයි.

(3) ක්‍රියාව ක්‍රියාමාත්‍රයම පමණක් දක්වන තැන භාවකාරක නමි.

බොනු, බීම ආදිය ඊට නිදර්ශනයි. බොනු හෝ පීම යන්නෙන් බොන තැනැත්තෙක් හෝ බොනු ලබන දෙයක් හෝ ප්‍රකාශ නොකෙරේ.

45. ක්‍රියාවේ ප්‍රකෘතියට හෙවත් මූල්‍යවිභාගයට **ධාතු** යයි කියනුලැබේ.

"රකී" යන ක්‍රියාව සෑදිනිබෙන්නේ "**රක්**" යන මූලවචනයෙනි. ඒනිසා රක්යනු ධාතුවයි.

46 ධාතුනු **අකර්මක, සකර්මක** යයි දෙවැදෑරුම් වෙති.

(1) කර්මයක් නොගන්නා ක්‍රියා නිපදවන ධාතු අකර්මකධාතු නම්.

යා, වූ, ඇති, සිටි, ගිළි, නිදි, බිය, රැදි, වැසි, සිනා, තුටු ආදිය අකර්මක ධාතුයි.

(2) කර්මයක්ගන්නා ක්‍රියා නිපදවන ධාතු සකර්මක ධාතුනම්.

කර, දු, ලබ, සිඳි, හර, වද, බඳ, කා, ගහ, ගණ, පිස ආදිය සකර්මක ධාතුයි.

47. සකර්මක ධාතුවකින් සිඩවූ ක්‍රියාවක් කර්තෘට හෝ කර්මයට හෝ බාරකොට යෙදියහැකිහෙයින් එය කර්තෘකාරකයෙහිද, කර්මකාරකයෙහිද, භාවකාරක යෙහිද යන තුනෙහිම යොජිතවේ. තුමුත් අකර්මක ධාතුවකින් සිද්ධවූ ක්‍රියාවක් කර්මයක් නොගන්නා හෙයින් කර්මකාරකයෙහි නොයෙදේ. එය යෙදිය හැක්කේ කර්තෘ, භාවයන කාරකදෙකෙහි පමණකි.

48. ප්‍රයොජ්‍ය ක්‍රියාවිෂයෙහි අකර්මක ධාතුවකින් සිඩවූ ක්‍රියා සකර්මක බවට පැමිණෙත්. එමෙන්ම සකර්මක ධාතුක ක්‍රියා කර්ම කීපයක් ගනිත්.

උදාහරණ:—1. ළමයා හඬයි- හඬයි යනු අකර්මකයි. ළමයා යනු කර්තෘයි.

ප්‍රයෝජ්‍ය ක්‍රියාවිෂයෙහි- ළමයා හඬවයි- හඬවයි යනු සකර්මකයි. ළමයා යනු එහි කර්මයි.

2. ගොන්නු තණකති- කති යනු සකර්මකයි. තණ යනු එහි කර්මයි.

ප්‍රයෝජ්‍ය විෂයෙහි- ගොනුන් තණ කවති- මෙහි ගොනුන්, තණ, යන දෙකම කර්ම විභක්ති භජනය කෙරෙත්.

49. ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි නොවූවත් කර්ම දෙකක් ගන්නා ධාතුහුද තිබෙත්. ඒවා විකර්මකනම් වෙත්. ඒ හර, කර යනාදියයි.

උදාහරණ:-වෙළෙඳා ගමට බඩු හරී. මෙහි ගමට යනුද බඩු යනුද හරී යන ක්‍රියාවේ කර්මයි.

අරක්කැමියා බත අඟුරු කෙළේය. මෙහි බත යනුද, අඟුරු යනුද කෙළේය යන ක්‍රියාවේ කර්මයි.

බත යන්නට ප්‍රකෘති කර්මය කියාද, අඟුරු යන්නට විකෘති කර්මය කියාද ව්‍යවහාර කරත්.

50. අකර්මක "වූ" ධාතුවෙන් සිඩවූ ක්‍රියාවෝ බෙහෙවින් කර්තෘන් දෙදෙනෙකු ගනිති.

**කුමරා රජවී** කීකල කුමරා යනුත් රජ යනුත් වී යන ක්‍රියාවෙහි කර්තෘයි. මෙහි කුමරා යනු ප්‍රකෘති කර්තෘ කියාද, රජ යනු විකෘති කර්තෘ කියාද ව්‍යවහාර කරත්.

51. ත්‍රෛකාලිකාදි ක්‍රියා සාදගැනීම පිණිස ධාතුන් කෙරෙන් පරව යොදන අක්ෂරයෝ ප්‍රත්‍යයෝ නම් වෙත්.

| උදාහරණ:- | ධාතු | | ප්‍රත්‍යය | | ක්‍රියා |
|---|---|---|---|---|---|
| | වස | + | ඊ | = | විසී |
| | වස | + | එහි | = | වෙසෙහි |
| | වස | + | අන්නෙමි | = | වසන්නෙමි. |

සැලකියයුතුයි:- ප්‍රත්‍යයන් ධාතු හා ගැලපීමේදී සන්ධි හා ස්වර විපර්‍යාසාදිය බොහෝසේ සිදුවේ.

52 ක්‍රියාවක ධාතුව සොයාගැනීම ඒ ක්‍රියාව භාව කාරකයෙහි හෝ අනාගත කාලික කර්තෘ කාරකයෙහි හෝ, ප්‍රයොජ්‍ය ක්‍රියාවෙහි හෝ යොදා ප්‍රත්‍ය වෙන්කර ගැනීමෙන් බොහෝදුරට කළහැකිය.

| ක්‍රියාව- | භාව- | අනාගත- | ප්‍රයොජ්‍ය- | ධාතුව |
|---|---|---|---|---|
| කරයි | කරනු | කරන්නේ | කරවයි | කර |
| සිටිති | සිටිනු | සිටින්නේ | සිටවයි | සිටි |
| නිදයි | නිදීම | නිදන්නේ | නිදවයි | නිදි |

යටකි ක්‍රියාපදවල නු, ම, අන්නේ, ව ආදී ප්‍රත්‍යයන් අහක් කරගත්කල ධාතුව කුමක්දැයි දැනගත හැකි බැව්පෙනේ. ඇතම් ක්‍රියාවල ධාතු මේ ක්‍රමයෙනුත් සොයාගැනීම දුෂ්කරයි. ජෙකප්‍රයොගම ඊට පමණි.

ඇතම් තැන ධාතුවක් නැතිවද නාමයකින් පරවක්‍රියා ප්‍රත්‍යයන් පමණක් යෙදීමෙන් ක්‍රියාර්ථයක් ගෙනදේ. ඊට නාමික හෙවත් ප්‍රත්‍යය මාත්‍ර ක්‍රියායයි කියනුලැබේ.

උදාහරණ. එතෙම රජෙකි. තීපෙරෙහි. මම බැලයෙක්මි. මෙහිවූ ධාතුවෙන් සිඩ වෙයි, වෙහි, වෙමි යන ක්‍රියාපද වෙනුවට ඉ, හි, මි යන ප්‍රත්‍යයන් පමණක් යෙදී තිබෙනබැව් පෙනේ.

53. **කර්තෘකාරක** ක්‍රියාය, **කර්මකාරක** ක්‍රියාය, **ප්‍රයොජ්‍ය** ක්‍රියාය, **විධි** ක්‍රියාය, **ආශීර්වාද** ක්‍රියාය, **අසම්**

භාව්‍ය ක්‍රියාය, පූර්ව ක්‍රියාය, මිශ්‍ර ක්‍රියායයි ක්‍රියා අට වැදෑරුම් වෙත්.

(1) මෙයින් කර්තෘකාරක, කර්මකාරක, ප්‍රයෝජ්‍ය යන ක්‍රියාත්‍රය කාලත්‍රයෙහිද, පුරුෂත්‍රයෙහිද, වචන ද්වයෙහිද යෙදෙත්.

(2) විධික්‍රියාව වර්තමාන අනාගතයන කාලවයෙහි සහ ප්‍රථම මධ්‍යම පුරුෂවයෙහිද, වචනවයෙහිද පමණක් යෙදේ.

(3) ආශිර්වාද ක්‍රියාව පුරුෂත්‍රයෙහි හා වචනවයෙහිද, අනාගතාර්ථයෙහිවූ වර්තමාන කාලයෙහි යෙදේ.

(4) අසම්භාව්‍ය, පූර්ව සහ මිශ්‍රක්‍රියාවන්ට කාලභේදයක් හෝ පුරුෂභේදයක් හෝ වචනභේදයක් හෝ නොමැතියි.

### කර්තෘකාරක සහ කර්මකාරක ක්‍රියා.

54. කාලපුරුෂාදියට ක්‍රියානාම ගැනීමේදී ධාතූවලට ඔබිනප්‍රකාර නිසි නිසි ප්‍රත්‍යයන් යොදගත යුත්තේය. එබැවින් ඒ ප්‍රත්‍යයන්ගේ විශෙෂවිභාග මෙහි පහත දක්වන නිදර්ශනයන්ගෙන් දතයුතුයි.

### ත්‍රෛකාලික කර්තෘකාරක ක්‍රියා.

අතීතකාල ප්‍රථමපුරුෂ.

| එකවචන. | බහුවචන. |
| --- | --- |
| ඒ-විජයරජ ලක්දිවැ පළමු රජයකෙළේ | උ-සුදනෝ සුසිරිළුවූ, ළුවූහ, ළුවූහු |
| ඉ-කුවෙනිය වනයටවැදුනි. | උෟ- කිවිඳෝ කව්ගෙතූ, ගෙතූහ, ගෙතූහු |
| ඒ-ගොළුඅබාරජ යහළුවා සිහසුනෙන් නෙරපී. | ඕ-දුදනෝ පව්වූකම් කළෝ, කළෝය |
| උ-ලිහිණිසා විළේකුමුටු. | උන්-දූමිටුවෝ දන් දුන්හ, දුන්හු |

අතීතකාල මධ්‍යමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| හි–නුඹ පාඩම කෙළෙහි. | හු–නුඹලා පාඩම් කළහු |

අතීතකාල උත්තමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| ඉම්–මම අකුරු උගතිම් | එමු–අපි පින්කෙළෙමු |
| ඉමි–මම දත්දුනිමි | මු –අපි ගීකීමු |
| එම්–මම කෑමකෑවෙම් | මෝ–අපි නුවරගියමෝ |
| එමි–මම ගී කීවෙමි | ම්හ, ම්හු–අපි සැබෑවම කීම්හ, කීම්හු |

වර්තමානකාල ප්‍රථමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| ඉ –හෙතෙම බත කයි | අත්, අති–ගොත්නු තණකත්, කති |
| ඕ –මුවා ගඟින් පැන්බෝ | ඉත්, ඉති–දනැතියෝ සැපවිඳිත්, විඳිති |
| ඒ –ඈතෘ වෙතෙහි වෙසේ | එත්, එති–දූරියෝ ඉසුරින් වැඩෙත්, වැඩෙති |
| ආ–ගෝලයා ගුරුවරුන් පුදා | ඔත්, ඔති- ළදරුවෝ කිරිබොත්, බොති |

වර්තමානකාල මධ්‍යමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| එහි–නුඹ සුසිරිකෙරෙහි. | හු–නුඹලා සුසිරිකරහු |

වර්තමානකාල උත්තමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| අම්, අමි–මම පොත්කියම්, කියමි | මු –අපිපොත්කියමු |
| ඉම්, ඉමි–මම අකුරු උගතිම්, උගතිමි. | මෝ–අපිවැඩකරමෝ |
| එම්, එමි–මම ගමටයෙම්, යෙමි. | එමු–අපි එහියෙමු |
| ඔම්, ඔමි–මම දහම්අමාබොම්, බොමි | ම්හ–අපි බත්උයම්හ |

| | | |
|---|---|---|
| මි- | මම පාඩම්කරමි. | මිහු-අපිරෙදිවියම්හු |

අනාගතකාල ප්‍රථමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| අන්නේ- ගොවියා අස්වැන්න ලබන්නේ. | අන්නෝ- වෙළෙන්දියෝ ඉසුරුමත් වන්නෝ |
| එන්නේ- බැලියාට කුලී දෙන්නේ. | අන්නාහු- සහෝදරුවෝ වැඩිදෙගුරුන්පුදන්නාහු |
| ඔන්නේ- අලසයා දුක් කඳුළුබොන්නේ. | නාහු- සියල්ලෝ ඉරබට කල රන්වලා දක්නාහු |
| තේ- නැණැතියා සතර කෙලි දක්නේ. | නාහ- කලට වැසි වස්නාහ |

අනාගතකාල මධ්‍යමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| අන්නෙහි- තුඹ ගමට යන්නෙහි. | අන්නහු- තුඹලා ගමට යන්නහු |

අනාගතකාල උත්තමපුරුෂ

| එකවචන. | බහුවචන. |
|---|---|
| අන්නෙමි-මමගුරුන්පුදන්නෙමි. | අන්නෙමු-අපි දුසිරි ඉවතලන්නෙමු |
| අන්නෙමි-මම ණයගෙවන්නෙමි. | අන්නමෝ-අපි දුක් දුරුකරන්නමෝ |

**1. කර්තෘකාරක ක්‍රියාවේ වරනැගීම.**

**කරධාතුව සකර්මකයි.**

අතීතකාලය.

| | එකවචන. | බහුවචන |
|---|---|---|
| ප්‍රථමපුරුෂ. | කෙළේ, කෙරුවේ | කළෝ, කළහු, කළහ, කෙරුවෝ කෙරුවහ, කෙරුවහු, |
| මධ්‍යම ,, | කෙළෙහි, කෙරුවෙහි | කළහු, කෙරුවහු |

| | | |
|---|---|---|
| උත්තම ,, | කෙළෙමි, කෙළෙමි.– | කෙළෙමු, කෙළෙමෝ, කෙළෙම්හ, කෙළෙම්හු |

වර්තමාන කාලය.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ. | කරයි, කෙරේ | කරත්, කෙරෙත්, කරති, කෙරෙති |
| මධ්‍යම ,, | කෙරෙහි | කරහු |
| උත්තම ,, | කරමි, කරම්, කෙරෙම්, කෙරෙමි | කරමු, කරමෝ, කරම්හ, කරම්හු |

අනාගත කාලය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කරන්නේ | කරන්නෝ, කරන්නාහ, කරන්නාහු |
| මධ්‍යම ,, | කරන්නෙහි | කරන්නහු |
| උත්තම ,, | කරන්නෙම්, කරන්නෙමි | කරන්නෙමු, කරන්නමෝ, කරන්නෙම්හ, කරන්නෙම්හු |

**සිටි ධාතුව–අකර්මකයි.**

අතීත කාලය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | සිටියේ | සිටියෝ, සිටියාහ, සිටියාහු |
| මධ්‍යම ,, | සිටියෙහි | සිටියහු |
| උත්තම ,, | සිටියෙම්, සිටීයෙමි | සිටියෙමු, සිටියමෝ, සිටියම්හ, සිටියම්හු |

වර්තමාන කාලය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | සිටි, සිටියි | සිටින්, සිටිති |
| මධ්‍යම ,, | සිටිහි, සිටහි | සිටහු, සිටුහු |
| උත්තම ,, | සිටිම්, සිටිමි | සිටිමු, සිටිමෝ, සිටිම්හ, සිටුම්හු |

අනාගත කාලය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | සිටින්නේ | සිටින්නෝ, සිටින්නාහ, සිටින්නාහු, සිටින්නාහ |
| මධ්‍යම ,, | සිටින්නෙහි | සිටින්නහු |
| උත්තම ,, | සිටින්නෙමි, සිටින්නෙම් | සිටින්නෙමු, සිටින්නමෝ, සිටින්නම්හ, සිටින්නම්හු |

මිට ප්‍රථම දක්වනලද නිදර්ශනයන්ගේ අනුසාර යෙන් ඒ ඒ ධාතුවලට නිසිතියම ප්‍රත්‍ය යොදා ක්‍රියා වරනැගිම මේනයින්ම කළයුතුයි.

——oo——

## 9 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත දක්වන ධාතු කර්තෘකාරකයෙහි වරනගනු. කප, උය, පිය, වැසි, සිනා, තුටු සහ හර.

——o——

## 2 කර්මකාරක ක්‍රියාවන්ගේ වරනැඟිම.

### කරධාතුව සකර්මකයි.

අතීත කාලය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කෙරිණි, කෙරුණි, කරනුලැබි | කෙරුණේ, කෙරුණහු, කරනුලැබූ කරනුලැබුවෝ |
| මධ්‍යම ,, | කෙරුණෙහි, කරනලදුයෙහි | කෙරුණහු, කරනුලැබුවහු |
| උත්තම ,, | කෙරුණෙමි, කෙරුණෙමි කරනුලැබුයෙමි කරනුලැබුයෙමි | කෙරුණමෝ, කෙරුණෙමු, කරනුලදුමෝ කරනුලදිමු |

වර්තමානකාලය.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කෙරෙයි, කරනුලබයි | කෙරෙත්, කෙරේති, කරනුලබත්, කරනුලබති |

මධ්‍යම ,, කෙරෙහී, කෙරෙහු,
කරනුලැබෙහි, කරනුලබහු,
කරනලදහු,
උත්තම ,, කෙරෙම් කෙරෙමු
කරනුලබම්, කරනුලබමු, කරනු
කරනුලබම් ලබමෝ, කරනුලබම්හ

අනාගත කාලය.

එකවචන බහුවචන
ප්‍රථම පුරුෂ කෙරෙන්නේ කෙරෙන්නෝ, කරනු
කරනුලබන්නේ ලබන්නෝ, කරනු
ලබන්නාහ, කරනු
ලබන්නාහු
මධ්‍යම ,, කෙරෙන්නෙහි, කෙරෙන්නහු
කරනුලබන්නෙහි කරනුලබන්නහු
උත්තම ,, කෙරෙන්නෙම්, කෙරෙන්නෙමු,
කෙරෙන්නෙමි, කෙරෙන්නමෝ,
කරනුලබන්නෙම්, කෙරෙන්නම්හ,
කරනුලබන්නෙම් කෙරෙන්නම්හු,
කරනුලබන්නෙමු,
කරනුලබන්නමෝ

---

**10 වෙනි අභ්‍යාස පාඨය.**

මෙහි පහත දක්වන ධාතු කර්මකාරකයෙහි වර නගනු. රක්, බඳ, වැඟි, පා, දිස්, ලබ සහ සිදි.

---

**3 ප්‍රයෝජ්‍ය ක්‍රියාව.** (පියදුකිරිය.)

55. අනුන් විසින් මෙහෙයන ලද්දහුගේ හෙවත් අනුන් ලවා කරවන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාව නම්.

"දැසි ළමයා නිදවයි" කීකල නිදීම කරන්නේ ළමයා වුවත් එය කරවන්නේ දැසියය, එබැවින් නිදවයි යනු ප්‍රයෝජ්‍ය ක්‍රියාවයි.

56. ප්‍රයෝජ්‍ය ක්‍රියාව ආශීර්වාද; අසම්භාව්‍යාදි ක්‍රියාවන්හිද යෙදෙත්.

ප්‍රයෝජ්‍ය ක්‍රියාව සාදාගැනීමට කර්තෘකාරකාදි ක්‍රියාවල ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර "ව" ප්‍රත්‍යය යොදනු ලැබේ.

කර්තෘකාරක ක්‍රියාව-කර + අති= කරති
ප්‍රයෝජ්‍ය ක්‍රියාව-කර + ව + අති= කරවති
කර්මකාරක ක්‍රියාව- කෙරේ, කරනු ලැබේ
ප්‍රයෝජ්‍ය ක්‍රියාව- කෙර"වේ", කර"ව"නු ලැබේ.

57. ප්‍රයෝජ්‍ය ක්‍රියා විෂයෙහි අකර්මක ධාතු සකර්මකවන බවද, සකර්මක ධාතු බහුකර්මක වනබවද යට කියන ලද්දේය.

ප්‍රයෝජ්‍ය ක්‍රියාව කරන තැනැත්තේ ශුද්ධ කර්තෘ නම් වෙයි. ඒ කරවන තැනැත්තේ හේතු කර්තෘ නම් වේ. ප්‍රයෝජ්‍ය ක්‍රියාවිෂයෙහි ශුද්ධ කර්තෘ කර්මත්වයගනී. ඇතම්තැන ඔහුකෙරෙන් පව ලා යන්නද යෙදේ.

නිදර්ශන. (1) වැඩකරුවා ළමයා හඬවයි මෙහි ළමයා ශුද්ධ කර්තෘයි. ඒ කර්මවිභක්තිය භජනයකෙරේ.
(2) රජදරුවෝ ප්‍රාඥයන් ලවා නීති සාදවති.

මෙහි ප්‍රාඥයන් යනු ශුද්ධ කර්තෘයි. ඒද කර්මත්වය ගෙනතිබේ. මෙහි නීතිය යනුද කර්මයි.

**වරනැගීම.**

**කර්තෘකාරක ප්‍රයෝජ්‍ය ක්‍රියා.**

අතීත කාලය.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කරවී,කෙරෙව්වේ | කරවූ, කෙරෙව්වෝ, කරවූහ,කරවූහු, කෙරෙව්වහ, කෙරෙව්වහු |

| | | |
|---|---|---|
| මධ්‍යම ,, | කරවුවෙහි,<br>කෙරෙව්වෙහි | කරවුවහු,<br>කෙරෙව්වහු |
| උත්තම ,, | කරවූවෙමි,<br>කරවූවෙම්,<br>කෙරෙව්වෙමි,<br>කෙරෙව්වෙම් | කරවූවෙමු, කරවූ<br>වමෝ,කෙරෙව්වම්හ,<br>කෙරෙව්වම්හු |

වර්තමාන කාලය.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ | කරවයි | කරවත්, කරවති |
| මධ්‍යම ,, | කරවෙහි | කරවහු |
| උත්තම ,, | කරවමි, කරවම් | කරවමු, කරවමෝ,<br>කරවම්හ,කරවම්හු |

අනාගත කාලය.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ | කරවන්නේ | කරවන්නෝ, කර<br>වන්නාහ,කරවන්<br>නාහු |
| මධ්‍යමපුරුෂ | කරවන්නෙහි | කරවන්නහු |
| උත්තම ,, | කරවන්නෙමි,කර<br>වන්නෙම් | කරවන්නෙමු,කර<br>වන්නෙමෝ, කර<br>වන්නම්හ, කර<br>වන්නම්හු |

**කර්මකාරක ප්‍රයෝජ්‍ය ක්‍රියා.**

කරධාතුව.

අතීතකාලය.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ | කරවිණි, කරවුණි<br>කරවනුලැබී,කර<br>වනලදී | කරවුණෝ, කරවනු<br>ලැබූ, කරවනලදහ- |

| | | |
|---|---|---|
| මධ්‍යම ,, | කරවුණෙහි, කරවනුලැබුවෙහි | කරවුණහු, කරවනුලැබූවහු, කරවනලදුවහු |
| උත්තම ,, | කරවුණෙම්, කරවුණෙමි, කරවනුලැබීමි, කරවනලදිමි | කරවුණෙමු, කරවනුලැබීමු, කරවනලද්දෙමු |

### වර්තමානකාලය.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කෙරවෙයි, කරවනුලබයි | කෙරවෙත්, කෙරවෙති, කරවනුලබත්, කරවනුලබති |
| මධ්‍යම ,, | කෙරවෙහි, කරවනුලැබෙහි | කෙරවෙහු, කරවනුලබහු, කරවනුලදහු |
| උත්තම ,, | කෙරවෙම්, කෙරවෙමි, කරවනුලබම්, කරවනුලබමි | කෙරවෙමු, කරවනුලබමු, කරවනලදිමු |

### අනාගතකාලය.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ | කෙරවෙන්නේ, කරවනු ලැබෙන්නේ | කෙරවෙන්නෝ, කරවනුලබන්නෝ, කරවනුලබන්නාහ |
| මධ්‍යම ,, | කෙරවෙන්නෙහි, කරවනුලබන්නෙහි | කෙරවෙන්නාහු, කරවනුලබන්නාහු |
| උත්තම ,, | කෙරවෙන්නෙම්, කෙරවෙන්නෙමි, කරවනුලැබෙන්නෙම්, කරවනුලැබෙන්නෙමි | කෙරවෙන්නාමු, කරවනුලබන්නෙමු, කරවනුලබන්නාමෝ |

## 11 වෙනි අභ්‍යාස පාඨය.

දුව, දා, මර, කප, දන, නැඟි, හර යන ධාතු ප්‍රයොජ්‍ය ක්‍රියා කර්තෘකාරකයෙහි හා කර්ම්මකාරකයෙහි වරනගනු.

### 4. ආශිර්වාද ක්‍රියාව.

58. පුරුෂත්‍රයෙහි හා උභයවචනයෙහි අනාගතාර්ථයක් පැතීමසම්බන්ධව ව්‍යවහාරකරන ක්‍රියාව ආශිර්වාද ක්‍රියානම්.

මේ ක්‍රියා විෂයෙහි වර්තමානකාලික ප්‍රත්‍යයෙන් පරව "වා" ප්‍රත්‍යය යෙදේ.

### 1. කර්තෘ කාරකයෙහි.

| | එකවචන. | බහුවචන |
|---|---|---|
| ප්‍රථමපුරුෂ – | හෙතෙම දිනේවා | ඔව්හු දිනෙත්වා |
| මධ්‍යමපුරුෂ – | තෝ දිනෙහිවා | තොපි දිනහුවා |
| උත්තමපුරුෂ– | මම දිනෙම්වා | අපි දිනමෝවා |

"දුදනකු නොදකිම්වා" ආදිනැන අනිෂ්ටාර්ථයක් පතනකල්හිදු මේ ක්‍රියාවම ව්‍යවහාරවේ.

### 2. කර්ම්කාරකයෙහි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ – | දිනනුලැබේවා | දිනනුලැබෙත්වා |
| මධ්‍යමපුරුෂ– | දිනනුලැබෙහිවා | දිනනුලබහුවා |
| උත්තමපුරුෂ- | දිනනුලැබෙම්වා | දිනනුලබමෝවා |

### 3. ප්‍රයොජ්‍යයෙන් සිද්ධ ආශිර්වාද ක්‍රියාව.
#### කර්තෘකාරක

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍රථමපුරුෂ – | දිනවේවා | දිනවෙත්වා |
| මධ්‍යමපුරුෂ – | දිනවෙහිවා | දිනවහුවා |
| උත්තමපුරුෂ– | දිනවෙම්වා | දිනවමෝවා. |

කර්ම්මකාරකයට "දිනවනු ලැබේවා" ආදිවශයෙන් යොදනු.

**12 වෙනි අභ්‍යාස පාඨය.**

බජ, බූ, යා, නස, පීස යන ධාතු ආශීර්වාද ක්‍රියා යෙහි වරනඟනු.

——oo——

## 5. අසම්භාව්‍ය ක්‍රියාව

59. කාල, පුරුෂ හා වචනයන් නොසලකා අ නියමාර්ථයක් හෝ කාලාර්ථයක් ප්‍රකාශකරන ක්‍රියාව අසම්භාව්‍ය ක්‍රියාව නම්.

60. වනනොවන බව නිශ්චයනැත්තේ **අනියම** ර්ථය නම්වේ. අනියමාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියාවට අ, ඔත්, ත්, න, නත්, තොත් යන ප්‍රත්‍යයෝ යෙදෙත්.

උදාහරණ:-

අ– **කළ** සෙහේ– කර + අ = කර = කළ

ඔත්– දන ඇ**තොත්**මැනවි. ඇති + ඔත්=ඇතොත්

ත්– මළ**ත්** ඝාම පවති. මර + ත් = මළත්

න– ය**න** බැරිනොවේ. යා + න = යන

නත්– මර**නත්** නොහැරෙම්. මර + නත් = මරනත්

තොත්–පිස**තොත්**හොඳයි. පිස+තොත්=පිසතොත්

61. කිසිතැනෙක අනියමාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියාව හැඟවීමට "නොත්" යන නිපාතයද යෙදේ. "අ, න" යන ප්‍රත්‍යයවලින් ඊට බාධානොවේ. **කළ** හොත්, කරනහොත් ආදිය ඊට නිදසුනුයි.

62. ක්‍රියා පවත්නා කාලය දක්වන්නේ **කාලාර්ථ** නම්. කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියාවට න, දී, ආම යන ප්‍රත්‍යයෝ යෙදෙත්.

න– කර**න** = කුරනකල්හි-කර + න = කරන

දි– යා**දී** = ගියකල්හි- යා + දි = යාදි

ආම– කළ**ාම** = කළකල්හි – කර + ආම = කළාම

කිසිතැනෙක "දි" ප්‍රත්‍යය විතතවේ. යද්දී, අඬ ලද්දී ආදිය ඊට නිදර්ශනයි.

63. ත්‍රෛකාලික ක්‍රියා අගට "නම්" යන නිපාතය යෙදූකල අනියමාර්ථයක් හඟවනුලැබේ. "හෙනෙම නොතියේනම් යහපති." "තෝ යන්නෙහිනම් මම එමි." "අපි නිදමුනම් විඩා සන්සිඳේ." ආදිය ඊට නිදර්ශනයි. නුමුත් ඒ අසම්භාව්‍ය ක්‍රියා නොවෙත්.

64. ප්‍රයෝජ්‍ය විෂයෙහි සිඩ අසම්භාව්‍ය ක්‍රියා "කරවතොත්," "පොවතොත්," "හඩවද්දී," "හැඬෙව්වාම" කවනු ලබතොත්, කවනු ලබද්දි යනාදියෙන් අවබොධ කටයුතු.

---o---

## 13 වෙනි අභ්‍යාස පාඨය.

1. ගිලි, නිදි, කා, පා, දු යන ධාතුවලින් අනියමාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියා දෙලසක් සාදනු.
2. ත, දී, ආම යන ප්‍රත්‍යයන් යොදා අසම්භාව්‍ය ක්‍රියා දෙලසක් දෙනු.

---o---

විධි ක්‍රියාව මිශ්‍ර ක්‍රියාව සහ පූර්ව ක්‍රියාව මිට ප්‍රථම විස්තරකරන ලද්දේය.

සැලකියයුතුයි. (1) ත්‍රෛකාලික ක්‍රියා අගට ඥාතිසූචනාර්ථයෙහි **ල**, **ලු** යන නිපාත යෙදූකල්හි ක්‍රියා ඉදුරන් විෂය නොවනබව හඟවයි. ඊට අප්‍රත්‍යක්ෂ* ක්‍රියා කියාද ඇතම්කෙනෙක් ව්‍යවහාරකරති.

ගියේල, ගියේලු, කරන්නේල, කරන්නේලු, කරත්ල, කරත්ලු ආදිය ඊට නිදසුනුයි.

(2) කර්තෘගේ උත්සාහයක් නැතිව සිද්ධවන්නාවූ ක්‍රියාවලට **නිරුත්සාහ ක්‍රියා** යයි කියනුලැබේ. මෙහි සාධනය කර්මකාරක ප්‍රත්‍යයවලින්ම වේ. කඩුව දිලිසුණි, සඳ බැබළිණි ආදිය ඊට නිදසුනුයි.

---

* පාලි සංස්කෘත භාෂාවල මීට, පරෝක්ඛා, පරොක්ෂායයි ව්‍යවහාරවේ. ඒ අතීතකාලිකයි.

(3) සකර්මක ධාතූන්ගෙන් සෑදෙන නිරුත්සාහ ක්‍රියා කර්තෘහට **නොමඟනූ, නොපිටකම්, හෝ ස්වයංකර්තෘ ස්වයංකර්මකයයි** කියත්. එයින් කර්තෘත් කර්මයත් වූයේ එකෙක්ම බව හඟවයි.

ගස කැඩේ, වලදබිඳේ ආදිය ඊට නිදසුනුයි.

---

## වාක්‍ය තැනීමෙහි චතුර්විධ පදයන්ගේ ව්‍යවහාරය.

## The use of the Four Parts of Speech in the Construction of Sentences.

65. පදනම් අරුත් පහළකරන අකුරක් හෝ අකුරුය. ම්‍රිහියන අර්ථයෙහි "වි" යනුද, ගමන්කෙරේ යන අර්ථයෙහි "යේ" යනුද, නැගියන අර්ථයෙහි "න" යනුද, යහපත් යන අර්ථයෙහි "සු" යනුද ඒකාක්ෂර පදසතරෙකි. නර, කෙරේ, පුන, පර යනු ද්‍වියාක්ෂර පදසතරෙකි. වෙළඳ, මහනෙල්, දිලුණි, බැඳුණෙනි, තුමුටු, විස්සල් ආදියද බහ්වාක්ෂර පදවෙති.

66. **නාමය**, **ආඛ්‍යාත** හෙවත් **ක්‍රියාය**, **උපසර්ගය** සහ **නිපාත** යයි පදයෝ සතරකොටසකට බෙදෙත්.

නාම සහ ක්‍රියා යනු කුමක්දැයි මීට යට ග්‍රන්ථයක කියන ලද්දේය

67. නාම සහ ක්‍රියාපදවල මුලයෙහි නොයෙක් අර්ථ ප්‍රකාශකරන පද **උපසර්ග** පදයි. ඒ විස්සෙක්වේ. එනම්:– ප, පර, අප, ස, අනු, අව, නි, වි, අ, අධි, සු, උ, අභි, පරි, උප, අප, පස්, පිළි, අති, පි යනුවේ. "දන" යන නාමපදයට "සු" යන උපසර්ගය යෙදූකල "සුදන" කියා සිදුවේ.

ගනිත් යන ක්‍රියාපදයට "උ" යන උපසර්ගය යෙදූ කල "උගනිත්" කියා සිදුවේ.

68. නාමක්‍රියා ආදි පදවල මුල මැද අග යෙදෙන විවිධාර්ථ පද **නිපාත** නම්වෙත්. ද, වැනි, අද, එද යනාදිය නිපාතපදයි.

"අගුණ" යන්නෙහි ඇති "අ" යන්නද "නොක ලේශ" යන්නෙහි ඇති "නො" යන්නද නිපාතපද වෙති.

මේ පදසතරෙහි විශෙෂවිභාග මතුග්‍රන්ථයක දක් වන්නෙමු.

69. සිංහලභාෂාවේ සියලුම ශබ්ද සරොඃනන නාම, ආඛ්‍යාත, උපසර්ග, නිපාත, යන පදසතරට ඇතු ලත් වේ. මේ සතරපදයම එක වාක්‍යයේද යෙදේ.

සිංහලයෝ නො පිරි හෙත්වා

මෙහි සිංහලයෝ යනු නාමපදයි. "නො" යනු නිපාතපදයි. "පිරි" යනු උපසර්ග පදයි. "හෙත්වා" යනු ක්‍රියාපදයි.

උපසර්ග හා නිපාත වාක්‍යතැනීමට ආවශ්‍යක නොවේ. ඒනිසා ඒවායේ යෙදීම යනාලාභයෙන් වේ. වාක්‍ය තැනීමේදී ඒවාගැනීම වුවමනාවූවිට ඒ ඒ තැ නට හොබනාපරිද්දෙන් ඒවා යොදගත යුතුයි.

"ළමයා නින්දටවනි" යන වාක්‍යයෙහි උපසර්ග යක් හෝ නිපාතයක් නොමැතියි. නුමුත් කාලය හැඟ වීම අභිමත නම් "දැන්" යන නිපාතපදය යොදා "ළමයා දැන් නින්දටවනි" කියා කියහැකියි. නින්දේ ආකාරයත් හඟවන්ට ඕනෑනම් "අති" යන උපසර්ග පදය යොදා "ළමයා දැන් අති නින්දටවනි" කියා වා ක්‍යය සාදගත හැකියි.

70. වාක්‍යතැනීමේදී ප්‍රධානකොට සැලකිය යුත්තේ කර්තෘ, කර්ම, ක්‍රියාදක්වන පදයන්ගේ පිළියෙ ළ කිරීමයි.

(1) කර්තෘදක්වන පදය මුලටද, කර්මයදක්වන පද ය දෙවැනිවද, ක්‍රියාපදය අවසානයෙහිද යෙදීම සව භාෂාවේ බහුල ව්‍යවහාරයයි.

උදා:-ගුරුවරු සිප්සතර උගන්වති.

කාව්‍යාදි රචනාවලැ කිසිවිටෙක මෙහි විකල්පයෙක් පැනේ.

නිදර්ශන- (1) සිදුහත්කුමරු සුදවැසියෝ පළමු පිළිගත්හු.

මෙහි කර්මය කර්තෘට පළමුවෙන් යොදතිබේ.

(2) "රවුළා මැරී රම්රජ"

මෙහි කර්තෘ අවසානයෙහි යොදා ඇත්තේය.

(3) "වීසනිවිනට එම පමාදය"

මෙහි ක්‍රියාව මුලට යොදතිබේ.

(2) කර්තෘ, කර්ම දක්වන පද සමාන ප්‍රත්‍යයව ඇති කල කර්තෘ පෙරටුවද, කර්මය පසුවද, ක්‍රියාව අවසානයෙහිද යෙදීම ආවශ්‍යකයි.

උදා:- නයා මැඩියා ගිලී යන්නෙහි කර්තෘ, කර්ම දක්වන පදදෙකේම ඇත්තේ "ආ" ප්‍රත්‍යය හෙයින් 'මැඩියා නයා ගිලී" කියා කර්මයමුලට යෙදුවොත් විරුද්ධාර්ථයක් හැඟේ.

**71.** කර්තෘ හෝ කර්මය අවසාන ක්‍රියාව හා බැඳෙන කල ඒවා ප්‍රථමා විභක්තියෙහිලා යෙදියයුතුවේ.

උදා:— දිවියෝ ගවයන් මරති.

මෙහි ක්‍රියාව කරන කර්තෘ දක්වන පදය "මරති" යන්න හා බැඳෙන හෙයින් "දිවියෝ" කියා ප්‍රථමා විභක්ත්‍යන්තව යෙදිතිබේ. දිවියන්කියා කර්තෘ විභක්ත්‍යන්තව යෙදුවහොත් සදොස්.

නවද මෙහි කර්මය ක්‍රියාව හා බැඳෙන ලෙසද මෙම වාක්‍යයම යොදාගත හැකිය.

උදා. දිවියන් (විසින්) ගවයෝ මරනු ලබති.

මෙහි කර්මය දක්වන පදය "මරනු ලබති" යන ක්‍රියාව හා බැඳෙන හෙයිප් "ගවයෝ" කියා ප්‍රථමා

විභක්ත්‍යන්තව යෙදී තිබේ. ගවයන් කියා කර්ම විභක්ත්‍යන්තව යෙදුවොත් සදොස්: "දිවියන්" යන කර්තෘ, ක්‍රියාව හා නොබැඳුණ හෙයින් කර්තෘ විභක්ත්‍යන්තවම සිටියේයි.

72. "මම පරවැඩ කරමි" යන වාක්‍යය කර්මකාරකයට පෙරළූකල මා විසින් පරවැඩ කරනුලැබේත් කියා යෙදේ. මෙහි ක්‍රියාව බැඳුණේ පරවැඩ යන පදය සමග නිසා එය උත්තමපුරුෂ ඒකවචන කර්තෘකාරකාර්ථය හැර ප්‍රථම පුරුෂ බහුවචන කර්මකාර්ථයට පෙරළී තිබේ. කර්තෘට භාරව ක්‍රියාව යොදනකල කර්තෘකාරක ත්‍රෛකාලික ක්‍රියාද, කර්මයට භාරව ක්‍රියාව යොදනකල කර්මකාරක ත්‍රෛකාලික ක්‍රියාද ගැලපිය යුතුයි.

73. කර්තෘ, කර්මයන් හා ක්‍රියාව බැඳීමේදී දෙකොටසේම පුරුෂ සහ වචනත් එකගවන ලෙස යෙදිය යුතුමැයි. මිට උදාහරණ යටදැක්වූ ක්‍රියා වරනැගිල්ලෙන් ගතයුත්තේය.

74. යමක් විචාරීමෙහි නිෂ්ඨා ක්‍රියාව අගට "ද" යන නිපාතය යෙදීම කරනුලැබේ.

උදා. ඔහු කුමක් කළේද? තෝ කොයිබ ගියෙහිද? මම කුමක් කරම්ද?

75. විධි ක්‍රියායෙහි කර්තෘ බොහෝ විට අත්හරිනු ලැබේ. "මෙමෙහෙවර" "පානදියන්" ආදි වශයෙන් ක්‍රියාව කරන්නා දක්වනු නොලැබේ. එබඳු තැන කර්තෘ අධ්‍යාහාරයෙන් ගැනේ. ත්‍රෛකාලිකාදි ක්‍රියාවලද ඇතැම් තැනෙක කර්තෘ අධ්‍යාහාරයෙන් *ගතයුතුවේ.

"කරනෙමි සිදත් සඟරා", කිපුවතක් පළකොට උන්නුද?" "නොමිලයේ ගායනා නොකෙරෙති"

---

* දෙනලද පදයක අනුසාරයෙන් නොදෙනලද පදයක් ගැනීම අධ්‍යාහාරයෙන් ගැනීම නමි.

යන වාක්‍යයන්හි "කරනෙම්" යන ක්‍රියාව හා බැඳෙන උත්තම පුරුෂ ඒකවචනාර්‍ථ "මම" යන්නද, "උන්නුද" යන ක්‍රියාව හා බැඳෙන මධ්‍යම පුරුෂ බහුවචනාර්‍ථ තෙපි යන්නද, "නොකෙරෙති" යන ක්‍රියා හා බැඳෙන ප්‍රථම පුරුෂ බහුවචනාර්‍ථ "ඔව්හු" යන්නද අධ්‍යාහාරයෙන් ගතයුත්තෝමය.

——o.o——

## 14 වෙනි අභ්‍යාස පාඨය.

1. මෙහි පහත දක්වන පාඨයෙහි ඇති පද වෙන් කොට ඒවායේ නම් කියනු.

"වෙසෙසින් නත්විසිතුරු මුවරදබර සුවිඳ ගඳ වහන පිපුම් වෙනෙන් සැදුම්ලද ජල තල ඇති සඳන් දහතලා දක්වනුවන් බඳු පස්පැහැ ඇති පද්මයන් විසින් ඒ මුහුදු සුපුෂ්පිතවි"

2. වෙසෙමි, හොබී, කෙරෙත්, දුන්නෙති, පිසන්නෙමු, යන්නෝය යන අපරක්‍රියාවන්ට යොග්‍යාකාර කර්‍තෘ කර්‍මාදීන් යොදා වාක්‍ය සයක් සාදනු.

3. මරනලදී, පිළිගනු ලැබීමු, හරිනු ලබන්නෙහි යන ක්‍රියා යොදා වාක්‍ය තුනක් තනනු.

4. අව, සු, දු, පිරි යන උපසර්‍ගද, න, ම, සේ, ආනිති, සහ යන නිපාතද යෙදෙනසේ පද ගළපා වාක්‍ය දසයක් ලියනු.

5. රජතෙම රට රකී, දුහුනෝ වණපොත් කරත්, අපි ගුරුන් පුදමු, තෙපි කුමක් කළහුද? ගොන්නු තණකති යන වාක්‍යයන් කර්‍මකාරකයට පෙරළනු.

6. උඩ රටියන් විසින් සිය රජතෙමේ ඉංග්‍රීසින්ට පාවාදෙනලදි, ඉංග්‍රීසීන් විසින් ලංකාවේ වාල් වෙළ

දාම නවත්වන ලද්දේය, දැන් සිංහලයන් විසින් බෙහෙවින් වෙළඳාම කරනුලැබේ, යන වාක්‍යයන් කර්තෘ කාරකයට පෙරළනු.

——oo——

76. ඉවන වෙන කීපදෙනෙක් කැටිව එක ක්‍රියාවක් කරත්නම් ඒ දක්වන ක්‍රියාපදය බහුවචනයෙහි යෙදිය යුතුවේ.

උදා:- ජෝන්,විලියම් සහ හෙන්රි සෙල්ලම්කරති.

77. සහ යන නිපාතය කර්තෘ අර්ථයෙහි යෙදූකල කිරීමෙහි බැදෙන්නෝ දෙදෙනෙක්වුවත් ක්‍රියාව එක වචනයගනි.

උදා:- ජෝන් සහ විලියම් සෙල්ලම් කරයි.

"මෙහි ජෝන් සමග විලියම් සෙල්ලම් කරයි" යන අර්ථයක් ඇතිවේ.

78. ප්‍රථම, මධ්‍යම සහ උත්තමපුරුෂවාචි කර්තෘන් දෙදෙනකු හෝ කීපදෙනකු කැටිව එක ක්‍රියාවක් කරනබව දක්වීමේදී ප්‍රථමපුරුෂ වාචිකශබ්දය මුලටද, මධ්‍යමපුරුෂ වාචිකශබ්දය දෙවැනිවද, උත්තම පුරුෂ වාචිකශබ්දය තෙවැනිවද යොදා අගින්සිටි පුරුෂයේ බහුවචනයෙහි ක්‍රියාව සිටවීම යෝග්‍යවේ.

උදාහරණ:-

1. හෙතෙමේත් තෝත් සෙල්ලම් කරහු.
   ඔහුත් උඹත් සෙල්ලම් කරහු.
2. තෝත් මමත් සෙල්ලම් කරමු.
3. හෙතෙමේත් මමත් සෙල්ලම්, කරමු.
4. අමරදාසත් නුඹත් මමත් සෙල්ලම් කරමු.

79. කර්තෘ හෝ කර්මය වර්ණනාකරනුවස් අර්ථ ක්‍රියා විශෙෂණවශයෙන් යෙදිය හැකිවේ.

උදාහරණ:- (1) හෙතෙම ගමනක් **යන්නේ** මග තිබූ වළක වැටී.

(2) ඈ තොමෝ ගමනක් **යන්නී** මග තිබූ වළක වැටුණාය.

(3) බොදුන් රසමුසු අවුලෙන් **යුත්** වූයේ අරක්කැමියා විසින් මෙහෙයන ලද්දේය.

මෙහි "ගමනක් යන්නේ" යනු ගමනක් යන්නාවූ යන අර්ථයෙහි කර්තෘවූ හෙතෙම යන්නට විශේෂණ වශයෙන්ද, "ගමනක්යන්නී" යනු ගමනක් යන්නාවූ යන අර්ථයෙහි කර්තෘවූ "ඈ තොමෝ" යන්නට විශේෂණ වශයෙන්ද, රසමුසු අවුලෙන් යුත්වූයේ යනු රසමුසු අවුලෙන් යුත්වූ යන අර්ථයෙහි කර්මයවූ බොදුන් යන්නට විශේෂණ වශයෙන්ද, යෙදී තිබේ.

80. අර්ථක්‍රියාපද විශේෂණ වශයෙන් යෙදීමේදී ඒවා කර්තෘ හෝ කර්මය දක්වන පදයාගේ ලිඞ්ග, විභක්ති හා වචනය භජනය කෙරෙත්.

උදා:- (1) ගොන්නු කෙතක තණකමින් සිටියාහු මගයන ගැහැන්යෙකු ඇණමැරූවෝය.

(2) ගැහැනියක් මගයන්නී කෙතක තණකමින්සිටි ගොනුන් විසින් ඇණ මරනලද්දීය.

මෙහි "සිටියාහු" යන අර්ථක්‍රියාපදය "ගොන්නු" යන පදයමෙන් ප්‍රථමාවිභක්ති බහුවචන භජනය කෙරේ.

"යන්නී" යන අර්ථක්‍රියාපදය "ගැහැනියක්" යන පදයමෙන් ප්‍රථමාවිභක්ති, ඒකවචන, ස්ත්‍රීලිඞ්ගය භජනය කෙරේ.

———oo———

## 15 වෙනි අභ්‍යාස පාඨය.

1. මෙහිපහත දක්වන පාඨවල ඉරිගසා ඇති තිත්තැන් සුදුසු වචනවලින් පුරවනු—

(1) බල්ලෙක් සහ බළලෙක් පොරකා—- (2) බල්ලෙකු සහ බළලෙක් සටන්—— (3) ජෝනුත් මමත් කොළඹ—— (4) නුඹත්——ගමටයමු. (5) කොල්ලොත්——බල්ලා මැරුවහුය.

2. කන්නේ, දුවන්නි, කියන්නෝ, හටන්නී, වූයේ යන අප්‍රධාන ක්‍රියා ශබ්ද විශේෂණ වශයෙන් යොදා වාක්‍ය පහක් තනනු.

3. පතිරාජ පිරිවෙන් හිමියෝ සඳසතර උගත් වනුකැමැත්තෝ අදියර දෙළසකින් යුත් හෙළු වියරණක් රචනාකළෝයි-යන වාක්‍යය කර්තෘකාරයට පෙරළනු.

4. එක එකෙහි පදසතරම යොදා වාක්‍ය පහක් සාදනු.

5. මෙහිපහත දක්වන වාක්‍යවලඇති දෙස් පහකොට ලියනු.

(1) මව්පියන් දරුවන් රකිති. (2) දරුවෝ ගුරුන් පුදයි. (3) තෝ ගියේ කොහේද. (4) ඔව්හු කළ වැඩේ පාරකයි. (5) බන්ඩාත් මමත් කොළඹ යන්නෙමි. (6) [sic] රජ තමරට රකිති (7) මමත් ඔහුත් සෙල්ලම් කළෙමි. (8) [sic] තෝ කළදේ මොකද? (9) අපි කීහැටියට කාරණය සිදුවිය. (10) තොපි ගුරුන්ටකීකරුවෙව. (11) නුඹ වාසියක් දිනේවා. (12) ඈතොමෝ ගීකියා නැටූවේ දුටුවෝ සතුටුකළාය. (13) [sic] හෙතෙමට වැඩ සිදුවේ: (14) ළමසින් ගුරුවරයෝවෙත එළඹියාහු සතර හොඳින් උගෙන සසසට පැමිණෙත්තෝය. (15) දරුවෙනි තොපිවිසින් සිප්සතර උගෙන දැහැමින් කල්කොටැ පරවැඩ ඉටුකරව.

# Sinhalese Grammar

for

## ශුද්ධිපත්‍රය.

| පිට. | පේළ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 4 | 24 | වෙන ස්වරකට | වෙන ස්වරයකට |
| 9 | 15 | ලිඳ | ළිඳ |
| 11 | 11 | ශ්‍රෙෂ්ඨාධිපති | ශ්‍රේෂ්ඨාධිපති |
| 12 | 21 | මුනි-වෘෂහ | මුනි-වෘෂභ |
| 13 | 7 | බලවෘෂහ | බලවෘෂභ |
| 40 | 10 | කර්තෘකාරකයට | කර්මකාරකයට |
| 14 | 18 | [illegible] | [illegible] |

කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිතයි.

1909.



